# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/SOLAR /PW
ඔබේ අංකය / உமது இல / Your No: ..................
දිනය / திகதி / Date: 2021.03.16

දිස්ත්‍රික් ලේකම් /දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ ,සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමණාකරුවන් සහ සංවර්ධන නිලධාරීන් වෙත.

**<u>විදුලිය නොමැති සැමට විදුලිය ලබාදීමේ වැඩසටහනේ සමාරම්භක කටයුතු.</u>**

ලංකා විදුලි බල මණ්ඩලය සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරන විදුලිය නොමැති සමෘද්ධි හා අඩු ආදායම්ලාභි පවුල් සඳහා විදුලිය ලබා දීමේ වැඩසටහන ඔබගේ සහයෝගය ඇතිව ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම වසරේ සිංහල හින්දු අවුරුද්දට පෙර සමෘද්ධි හා සමෘද්ධි සහනාධාර ලබාගැනීමට පොරොත්තු ලේඛන ගතව සිටින විදුලිය නොමැති පවුල් සඳහා විදුලිය නොමිලේ ලබාදීම මෙම වැඩසටහනේ මූලික අරමුණකි. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි බැංකු විසින් "සමෘද්ධි ආලෝකා" නමින් සහන ණය යෝජනා ක්‍රමයක්ද හඳුන්වා දී ඇත.

මෙම වැඩසටහනේ ප්‍රධාන සමාරම්භක උත්සවය බදුල්ල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගමින් 2021.03.19 දින පැවැත්වීමට විදුලි බල මණ්ඩලය කටයුතු සූදානම් කර ඇති බව අප වෙත දන්වා ඇත. එසේම අනෙකුත් දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්‍රාදේශීය සභා නගර සභා කේන්ද්‍රගත කරමින් එකී සභාපතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් 2021.03.20 දිනය පුරා සමාරම්භක උත්සව පැවැත්වීමට ද විදුලි බලමණ්ඩලය හා විදුලිබල අමාත්‍යාංශය කටයුතු සූදානම් කර ඇත.

ඒ අනුව මෙම උත්සව අවස්ථාවට නොමිලේ විදුලිය සම්බන්ධතා ලබාගැනීමට සුදුසුකම් ලැබූ පවුල් සම්බන්ධ කිරීමටත් "සමෘද්ධි ආලෝකා ණය" වැඩසටහන යටතේ ණය ලබා ගත් ණයලාභීන් සඳහා ණය ප්‍රධානයන් හා සුදුසු නිවසවලට නව විදුලි සම්බන්ධතා ලබාදීම වැනි කටයුතු සඳහා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය නිලධාරීන් හා සම්බන්ධ වෙමින් අවශ්‍ය කටයුතු ඉටුකරන මෙන් මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

විදුලිය නොමැති සැමට විදුලිය ලබාගැනීමට ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

01. ලේකම්,විදුලිබල අමාත්‍යාංශය - කාරු.දැ.ස
02. ලේකම්,සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කාරු.දැ.ස
03. සභාපති,ලංකා විදුලි බල මණ්ඩලය - කාරු.දැ.ස සහ අ.ක.ස.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |